ලංකාදීප.lk
අන්තර් ජාලයට එක්වූ ප්‍රථම සිංහල පුවත්පත

2006 ජනවාරි මස 10 වැනිදා අඟහරුවාදා

විමසුම

# සාම්ප්‍රදායික ගමනින් අපේ නායකයන්ට මිදිය නොහැකිද?

## නීතිඥ ශිරාල් ලක්තිලක

ශ්‍රී ලංකාවේ ගොඩනැඟී තිබෙන්නේ අමුතුම ආකාරයේ දේශපාලන සංස්කෘතියකි. පසුගිය වසර පනහක කාලයක සිට එකම ස්වරූපයකින් ක්‍රියාත්මක වන දේශපාලන සංස්කෘතියක් දක්නට ලැබෙන්නේ මෙරට පමණක් වීමට පුළුවන. මෙරට දේශපාලන සංස්කෘතියේ කිසිදු වෙනසක් සිදු නොවූයේ ඇයිද යන්න සම්බන්ධයෙන්ද මෙහිදී අවධානයට ලක්කළ යුතු කරුණකි. ඒකාකාරීව ගමන්කරන දේශපාලන සංස්කෘතියේ දක්නට ලැබෙන ලක්ෂණ කීපයකි. නිවැරැදි දෙයක් නිවැරැදිව කිරීමට හැකිවීම මේ දේශපාලන සංස්කෘතියේ එක් ලක්ෂණයකි. එමෙන්ම නිවැරැදි දෙයක් වැරැදියට කළ හැකිය. වැරැදි දෙයක් නිවැරැදිව කිරීමටද පුළුවන. වැරැදි දෙයක් වැරැදියට කළ හැකිය. අපේ දේශපාලන සංස්කෘතියේ නිරන්තරයෙන්ම දක්නට ලැබෙන්නේ නිවැරැදි දෙයක් වැරැදියට කිරීම සහ වැරැදි දෙයක් වැරැදියට කිරීම යන ලක්ෂණය.

මෙහිදී දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ ගණනාවක් තිබේ. ඕනෑම රටකට මූලෝපායික අවශ්‍යතා තිබේ. ලෝකයේ අනෙකුත් රටවල් සමග ගනුදෙනු කිරීමේදී මේවා හට ගන්නේ පරම මූලෝපායික අවශ්‍යතා වශයෙනි. අනෙක් රටවල් සමග ගනුදෙනු කිරීමේදී මෙම අවශ්‍යතා සංකලනය වනවිට සාපේක්ෂ මූලෝපායික අවශ්‍යතා බවට පත්වනු ඇත. නමුත් ප්‍රධාන වශයෙන්ම සිදුවිය යුත්තේ මූලෝපායික අවශ්‍යතා හටගැනීමය. ලංකාවේ දේශපාලන සංස්කෘතියේ පසුගිය වසර පනහක කාලයේදී එවැනි මූලෝපායික අවශ්‍යතා තිබුණේ නැත. එදා සිටි තැනම අදත් සිටීමට සිදුවී තිබෙන්නේ ඒ නිසාය.

මූලෝපායික අවශ්‍යතා තිබීම සඳහා වූ දේශපාලන ඥානයක් මෙරට දේශපාලකයන්ට නොතිබීම දෙවැනි ලක්ෂණය වශයෙන් පෙන්වාදිය හැකිය. දේශපාලකයන් දාර්ශනික දේශපාලකයන් විය යුතු බව ප්ලූටෝ පෙන්වා දී තිබේ. පසුගිය වසර පනහක කාලයේදී දාර්ශනික දේශපාලකයන් සිටියාද යන බරපතල ගැටලුව මේ අනුව මතුවන්නකි. මේ රටේ සිටියේ සාමාන්‍ය නායකයන් පමණි. සුවිශේෂී නායකයන් සිටියේ නැත. නේරු, ගාන්ධි, මහතීර් මොහොමඩ්, ලී ක්වාන් යූ, චර්චිල් වැනි නායකයන් මේ රටේ බිහිවූයේ නැත. මෙවැනි නායකයන් බිහි නොවීමද මෙරට දේශපාලන සංස්කෘතිය වෙනස් නොවීමට බලපා තිබෙන

කරුණකි. මූලෝපායික අවශ්‍යතා මේ රටේ බිහි නොවීමටද මෙම කරුණ ඍජු ලෙසම බලපා තිබෙන බව අමුතුවෙන් කිවයුතු නැත.

සාමාන්‍යකරණය වූ දේශපාලකයන්ට පුළුල් වූ ඥාන විභාගයක් නොමැතිවීම නිසා තම විරුද්ධ පාක්ෂිකයන් දෙස බැලුවේ බලය උදුරාගන්නට එන හතුරන් වශයෙනි. මෙය තුන්වැනි කරුණ වශයෙන් පෙන්වාදීමට පුළුවන. මේ නිසා දේශපාලන හතුරන් ඇතිවුණි. නමුත් මේ වෙනුවට වෙනත් රටවල දක්නට ලැබෙන්නේ ප්‍රතිපත්තිමය විරුද්ධවාදීන්ය. මේ කරුණු නිසා මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ නිරන්තරයෙන්ම දක්නට ලැබෙන්නේ මඩ ගසා ගැනීම්, චරිත ඝාතන මගින් හෝ භෞතිකවම තම විරුද්ධවාදීන් විනාශ කර දැමීමය. මෙය ප්‍රතිපත්තියක් ලෙසම ස්ථාවර වෙමින් පැවතීම බෙහෙවින්ම කනගාටුදායක තත්ත්වයකි.

පසුගිය මැතිවරණයේදී මෙම කරුණ මනාව ඔප්පු වුණි. දිගින් දිගටම සිදුවූයේ මඩ ගසා ගැනීම්ය. චරිත ඝාතනය, ප්‍රතිපත්තිමය සාකච්ඡාවක් තිබුණේ නැත. එවැනි ප්‍රතිපත්තිමය සාකච්ඡා මෙරට දේශපාලන වේදිකාවේ බොහොම විරලය. රූපවාහිනී සංවාදයක් පැවැත්වුවද එයද ප්‍රතිපත්තිමය සාකච්ඡාවක ස්වරූපයක් ගන්නේ නැත. මෙරට දේශපාලන සංස්කෘතියේ තිබෙන මෙම ස්වරූපය හේතුවෙන් ජාතික ප්‍රතිපත්තියක්ද නොමැත. අවම වශයෙන් රජයට සහ විරුද්ධ පක්ෂයට එකට එකතු වී තීන්දු ගැනීම කළ නොහැක. එකතු වී කටයුතු කිරීමට නොහැකිවීම හේතුවෙන් වසර පනහක් තිස්සේ යුද්ධය, දුප්පත්කම, ඌණ සංවර්ධනය යනාදිය වර්ධනය වී තිබේ. රටක් වශයෙන් ගෙන බලනවිට සංවර්ධනය වී තිබෙන්නේ කොළඹ පමණි. පරායත්ත ආර්ථිකයක් ගොඩනැගී තිබේ. යාපනයේ හෝ වේවා මාතර හෝ වේවා ගොවියා, ධීවරයා උපයා ඉතිරි කරන මුදල් කොළඹට එකතු වී කොළඹ සිටින එක් පංතියක් එයින් ණය ලබාගෙන ඔවුන් පමණක් දියුණු වෙමින් සිටී. මේ ක්‍රමය වෙනස් කිරීමට දේශපාලකයන් උනන්දු වන්නේද නැත. එවැනි වෙනසක් කිරීමට ජනතාවට ඉඩ නොදීම කනගාටුවට කරුණකි.

මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබෙන්නේ ලංකාවේ දේශපාලන අධ්‍යාපනය දියුණු නොවීම නිසාය. දැනුම තිබෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි. එම දැනුම ස්වභාෂාවට පරිවර්තනය වීම සිදුවන්නේ මන්දගාමීවය. මේ නිසා දේශපාලකයන්ට හෝ සාමාන්‍ය ජනතාවට දේශපාලන දැනුම ලැබෙන්නේ නැත. එ.ජා.පයේ සහ ශ්‍රී.ල.නි.ප. දේශපාලකයන් හා පාක්ෂිකයන්ට වඩා රැඩිකල් යැයි කියා ගන්නා ජ.වි.පෙ. බෙහෙවින්ම අන්තයට වැටී තිබේ. ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ නොවුනද ජාතික හෙළ උරුමයේ දේශපාලන නායකයන්ට යම් ඥාන විභවයක් තිබේ. ඒ බව ඔවුන් සනාථ කර තිබේ. ජාතික හෙළ උරුමයේ මතය සමග එකඟ වීමට නොහැක. මා එයට එක හෙළා විරුද්ධය. නමුත් එතැන බුද්ධිය තිබේ. ඊට සාපේක්ෂව බලන විට ජ.වි.පෙ.ට බුද්ධිය නැත. සාම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඔවුන්

දරන ස්ථාවරයෙන් එය හොඳින්ම පැහැදිලිය. ඔස්ලෝ සම්මුතිය සම්බන්ධයෙන් ඔවුන් දරන්නේ විරුද්ධ මතයකි. හෙළ උරුමය කියා සිටින්නේ එයට ඔවුන් එකඟ නොවූ නිසා ප්‍රශ්නයක් නොවන බවය. ඒ සමගම ඔවුන්ගේ නියෝජිතයකු කියා සිටින්නේ ඉන්දියාවේ ක්‍රමයට සමාන ෆෙඩරල් ක්‍රමයකට අකමැති නොවන බවය. එවැනි තීරණයක් ගැනීමට හැකිවී තිබෙන්නේ බුද්ධිය තිබෙන නිසාය.

එ.ජා.පෙ. සහ ශ්‍රී.ල.නි.ප. දෙගොල්ලම සිටින්නේ සිහින ලෝකවලය. යුරෝපය දියුණු වී සිටින්නේ එක් එක් කාලවකවානුවලදී වෙනස්වීමේ නිවැරැදි තීන්දු ගත් නිසාය. 1970 ගණන් දක්වා ඒ අය අනුගමනය කළේ සුබසාධන රාජ්‍ය සංකල්පයකි. ඔවුන් එසේ කළේ ජනතාවට යහපත උදාකළ හැකි ක්‍රමය වශයෙන් සුබසාධන සංකල්පය විශ්වාස කිරීම හේතුවෙනි. 1980 ගණන් වනවිට මේ ක්‍රමය සාර්ථක නොවන බව වටහාගත් ඔවුන් නව ලිබරල් ආර්ථිකයට යොමුවුණි. මේ මාරුවීම ඉතාම රැඩිකල් ආකාරයෙන් සිදුවූවකි. 1990 ගණන් වනවිට මේ ආර්ථික ක්‍රමය අසාර්ථක වන බව ඔවුන් වටහා ගත්තේය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සහ වෙළෙඳපොළ ආර්ථිකයේ ලක්ෂණත් එකතු වූ ආර්ථිකයක් වෙත ඔවුන් ගමන් කරමින් සිටින්නේ ඒ නිසාය. නමුත් මෙවැනි දුරදක්නා නුවණින් කටයුතු කිරීමේ හැකියාවක් මෙරට ගොඩනැගී තිබෙන දේශපාලන සංස්කෘතියෙන් දේශපාලන නායකයන්ට ලබාදී නැත.

ශ්‍රී.ල.නි.ප.යේ නායකත්වය තවමත් ජීවත් වන්නේ සුබසාධන රාජ්‍ය සංකල්පයේය. එ.ජා.පෙ. නායකත්වය ජීවත්වන්නේ නව ලිබරල් ආර්ථිකයේය. තිබෙන අභියෝගවලට මුහුණදීමට මෙම ක්‍රම දෙකෙන්ම අපේක්ෂිත ආකාරයේ දායකත්වයක් ලැබී නැත. ජපානය, ඇමරිකාව, බ්‍රිතාන්‍ය ආදී රටවල් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සහ වෙළෙඳපොළ ආර්ථිකයේ ලක්ෂණ එකතු වූ ආර්ථිකයක් වෙත යොමුවෙමින් සිටින්නේ ඒ නිසාය. දුප්පත් ජනතාවට ආහාරපාන නොමැති වනවිට නිරායාසයෙන්ම ඒ අය විවිධ කැරලි කෝලාහලවලට යොමුවනු ඇත. නීතියේ බලය අභියෝගයට ලක්වනු ඇත. එනිසා මේ යථාර්ථය දේශපාලකයන් තේරුම් ගත යුතුය. මෙම කරුණු ශ්‍රී.ල.නි.ප. නායකත්වයත් එ.ජා.පෙ. නායකත්වයත් තේරුම්ගෙන සිටිනවාද යන්න ප්‍රශ්නය වී තිබේ. අනාගතයේ ඇතිවිය හැකි නායකයන්ට රාජ්‍යකරණය පිළිබඳ ගැඹුරු දැනුමක් තිබේද යන්න බරපතල ප්‍රශ්නයකි.

සාම ක්‍රියාදාමයෙන් මෙම කරුණ මනාව සනාථ කොට තිබේ. සාමය උදා කිරීමට සිදුවූයේ නැතිනම් උතුරු නැගෙනහිර ප්‍රදේශවල දෙමළ අන්තවාදයක් නිර්මාණය කර යුද්ධයකට පාර කපා දුන්නේ සිංහල සමාජය බව මා දරන මතයයි. 1949දී ජී.ජී. පොන්නම්බලම්ගේ දෙමළ කොංග්‍රසයෙන් චෙල්වනායගම් වෙන්වුණි. ලංකාවට ෆෙඩරල් ආණ්ඩුවක් අවශ්‍ය බව ඔහුගේ අදහස වී තිබුණි. ඒ වෙනුවෙන් අභියෝග කරමින් 1951 අතුරු මැතිවරණයට තරග වැදුණි. නමුත් එ.ජා.පෙන් තරග කළ නඩේසන්

මහතාට ඔහු පරාජය විය. මෙයින් පැහැදිලි වන්නේ 1951 දී දෙමළ ජනතාව ෆෙඩරල් ආණ්ඩුක්‍රමය ප්‍රතික්ෂේප කළ බවය. 1960 වනවිට සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමත් දෙමළ භාෂාවට යම් තැනක් නොදීමත් හේතුවෙන් චෙල්වනායගම් වීරයෙක් කළේ සිංහල සමාජය බව පැහැදිලි කරුණකි. මේ කාලයෙන් පසුව වෙනම රාජ්‍ය සංකල්පය පෙරට පැමිණ තිබුණි. ෆෙඩරල් පක්ෂයේ සභාපති රාසමානික්කලිංගම් 1961 පක්ෂ සම්මේලනයේදී ප්‍රකාශකර තිබුණේ වෙනම රාජ්‍ය සංකල්පය යටතේ වැඩ කරන්නේ නම් එය දෙමළ ජනතාවගේ සියදිවි හානිකර ගැනීමක් වශයෙනි. 1971දී නවරත්නම් කයිට්ස්වලට තරග කළේ වෙනම රාජ්‍ය සංකල්පය නමැති සටන් පාඨය යටතේය. නමුත් එවර දෙමළ ජනතාවද ප්‍රතික්ෂේප කළේය. 1970 සිට 1980 දක්වා සිංහල සමාජය කටයුතු කළේ වෙනම රාජ්‍ය සංකල්පය ඇතිවන ආකාරයෙනි. පාර්ලිමේන්තුවේ තිබූ දෙමළ නියෝජනය එළවා දැමීමටද කටයුතු යෙදුණි. මේ අනුව බලන විට සිංහල දේශපාලනය රාජ්‍යකරණය කිරීමේ නොහැකියාව නිරන්තරයෙන්ම පෙන්නුම් කර තිබේ. අද දක්වාම තිබෙන්නේ එවැනි තත්ත්වයකි.

එල්.ටී.ටී.ඊ.ය මේ තරම් බරපතල ගැටලුවක් වී තිබෙන්නේ දකුණේ දේශපාලන වරදිනි. එක් එක් අවස්ථාවලදී නිවැරදි කළමනාකරණයෙන් යුතුව කටයුතු කළේ නම් මෙවැනි තත්ත්වයක් ඇතිවන්නේ නැත. නමුත් අපේ දේශපාලන සංස්කෘතියේ එවැනි ලක්ෂණ පෙන්නුම් කරන්නේ නැත. මුළු දකුණු ඉන්දියාවටම පැවැතියේ මැඩ්‍රාස් නමැති එක් ප්‍රාන්තයකි. තෙළිඟු, දෙමළ, අන්නඩ්, මලයාලම් ආදී භාෂා කතා කරන සියලු දෙනාම සිටියේ මේ ප්‍රාන්තයේය. නමුත් හින්දි භාෂාව රාජ්‍ය භාෂාව කිරීමට කටයුතු කිරීමෙන් නේරු ප්‍රතිපත්තිය ගැන කලකිරුණු අන්නදොරේ නමැත්තකු වෙනම දෙමළ රාජ්‍යයක් සඳහා සටන් කළේය. ප්‍රභාකරන් ඊළම ඉල්ලා සිටින්නා සේ අන්නදොරේ ඉල්ලා සිටියේ තමිල්නාඩුවය. එහිදී උතුරු ඉන්දීය පාලකයන් කළේ භාෂාමය පදනම යටතේ ප්‍රාන්තය නැවත සලකුණු කිරීමය. මායිම් වෙනස් කළේය. දෙමළ කතාකරන අයට තමිල්නාඩුව ලබාදුනි. ප්‍රාන්තය දී අන්නදොරේ ඉල්ලා සිටි නමද ලබාදුනි. නමුත් උතුරු නැගෙනහිර ප්‍රදේශවල මෙවැනි වෙනස්කමක් කළහොත් කොළඹ කවර මට්ටමේ උද්ඝෝෂණ ඇතිවිය හැකිද? අවසානයේ 1965දී අන්නදොරේ "අපි දෙමළ" ව්‍යාපාරය අහෝසි කළේය. මේ ආකාරයේ දේශපාලන තීරණ ගැනීමේ හැකියාවක් මෙරට දේශපාලකයන්ට නැත. මෙවැනි දූරදර්ශී භාවයක් අපේ දේශපාලන නායකයන්ට නොමැත. ජන සමාජයටද නැත.

දේශපාලන සංස්කෘතිය තුළ සාකච්ඡාවට ලක්විය යුත්තේ එවැනි කරුණුය. නමුත් අවාසනාවකට මෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා සංවාද ඇතිවන්නේ නැත. දේශපාලකයන් විවිධ පක්ෂවලට වී බලය ලබාගන්නේ කෙසේද යන්න සිතමින් කල් ගෙවනවා හැරෙන්නට රට ඉදිරියට ගෙනයා හැකි අංශයක් ගැන කල්පනා කරන බවක් පෙනෙන්නට නැත. මේ රට ගොඩනැගීමට අවශ්‍ය වන්නේ නිවැරදි අවස්ථාවේ නිවැරදි

තීන්දු ගත හැකි දේශපාලන නායකත්වයකි. එවැනි නායකත්වයක් බිහිකිරීමට අවශ්‍ය සමාජ දේශපාලන පසුබිමද මේ රටේ ස්ථාපිත කළ යුතු කාලය එළඹ ඇති බව පැහැදිලි කරුණකි.

කුමන ක්‍රියාදාමයක වුවද පසු විපරමක් තිබිය යුතුය. වැරැදි නිවැරැදිකර ගැනීමට හැකිවන්නේ එවිටය. නමුත් අපේ සමාජයේ, දේශපාලන තන්ත්‍රයේ එවැනි පසු විපරමක් තිබේද යන්න බරපතල ගැටලුවකි. දේශපාලනඥයා එදා සිටම කළ වැරැදි අදටත් කරමින් සිටින්නේ කිසිදු පසු විපරමක් නොමැති නිසාය. අප තවදුරටත් මෙම ක්‍රමය අනුගමනය කළහොත් මේ තත්ත්වයෙන් මිදීමට හැකියාවක් ලැබෙන්නේ නැත. රජය මෙන්ම විරුද්ධ පක්ෂයත් අනෙකුත් දේශපාලන පක්ෂත් මේ කරුණ අවබෝධ කරගත යුතුය. රට ඉදිරියට ගෙනයාමට අවශ්‍ය දේශපාලන පසුබිමක් සකස් කරගත යුතුය. ප්‍රශ්න තිබෙන්නේ මෙරට දේශපාලන සංස්කෘතියේ පමණක් නොවේ. ප්‍රජා සංස්කෘතියේද ප්‍රශ්න තිබේ. නමුත් එසේ ප්‍රශ්න තිබීම ප්‍රශ්නයක් වශයෙන් අප දකින්නේද නැත. එයින් පැහැදිලි කරන කරුණක් තිබේ. එනම් මේ සමාජය කොතරම් රෝගාතුර වී තිබේද යන්නයි.

ලංකාවේ රාජ්‍ය රෝගාතුර වී තිබේ. එය නැවත සකසාගත යුතුය. නමුත් එසේ නැවත සකසා ගැනීමට නොහැකි වී තිබෙන්නේ සම්මුතියක් නොමැතිවීම හේතුවෙනි. දේශපාලන පක්ෂ සිටින්නේ විවිධාකාර මතිමතාන්තර කරපින්නාගෙනය. අවම වශයෙන් අවශ්‍ය ප්‍රමාණයට සම්මුතියක් ඇතිකර ගැනීමටද අපට නොහැකි වී තිබේ. මෙසේ නොහැකි වී තිබෙන්නේ එක් එක් දේශපාලන පක්ෂවල මෙන්ම සමස්ත දේශපාලනයම ප්‍රශ්නගත වීම හේතුවෙනි. එකිනෙකා සතුරා වශයෙන් දකිනා සතුරු දේශපාලන සංස්කෘතියක සම්මුතියක් ඇතිවිය නොහැක. නිවැරැදි දර්ශනයක් මෙරට දේශපාලනයේ දක්නට ලැබෙන්නේ නැත. ඉදිරි වසර දහයේදී හෝ විස්සේදී කවර ඉලක්කයකට රට ගෙනයනවාද යන පැහැදිලි ප්‍රතිපත්තියක් නායකයන්ට නැත. දැක්මක් නැත. රට පාලනය කරන සියලුදෙනාම කරන්නේ එකම දෙයකි. ඔවුන් බලන්නේ බලය ලබාගැනීමට පමණි. වත්මන් රජයේ ප්‍රධාන ඇමතිවරයකු වරක් ප්‍රකාශ කර තිබුණේ සුනාමි සහන මණ්ඩලය හොඳ බවත් නමුත් එමගින් බලය අහිමිවන්නේ නම් එයින් වැඩක් නැති බවත්ය. ඔවුන්ගේ දර්ශනය එවැන්නකි. රට පිළිබඳ ප්‍රශ්නයක් ඔවුන්ට නැත.

මේ දේශපාලන සම්ප්‍රදායෙන් මිදිය යුතුය. රටට සාමය උදාකිරීම මූලෝපායික අවශ්‍යතාවක් වශයෙන් වත්මන් ජනාධිපතිවරයා වටහාගෙන තිබේ. සාම සාකච්ඡා කඩිනමින් ආරම්භ කිරීමට උත්සාහ දරන්නේ එනිසාය. මේ උත්සාහයට සියලු දෙනාගේම සහාය ලබාදිය යුතුය. නමුත් සිදුවෙමින් පවතින්නේ පක්ෂ හා විපක්ෂ කොටස් එක්වී කකුලෙන් ඇදීමය. රටට අවශ්‍ය දේ නිවැරදිව තේරුම්ගත නොහැකි දේශපාලකයන්

සිටින විට මහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න බරපතල ප්‍රශ්නයකි.

මේ රටේ දේශපාලන සංස්කෘතිය ඔඩු දුවන තත්ත්වයට පත්වී තිබේ. මෙයින් ගොඩඒම පහසු කරුණක් වන්නේ නැත. මේ අවුල ලිහා ගැනීමේදී ජනමාධ්‍ය වගකිවයුතු හා බුද්ධිමය ආකාරයෙන් කටයුතු කළ යුතුය. බුද්ධිමය නිම් වළලු පුළුල් කළ යුතුය. හරවත් සංවාද ඇතිකළ යුතුය. වහාම ජාතික එකඟතාවකට පැමිණිය යුතු බවට ඒ හරහා දේශපාලනයට බලපෑම් කිරීමට පුළුවන. ජාතික වශයෙන් වැදගත් තීන්දු තීරණ ගත හැකි මට්ටමට දේශපාලනය යොමුකළ යුතුය. ජාතික සම්මුති ඇතිකර ගැනීමට දේශපාලන නායකත්වය යොමුකිරීමේ දැඩි අවශ්‍යතාව දැඩිව මතුවී තිබේ.